(iv) ඉහත සඳහන් රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සියලුම දෙනා විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 15ක කාලය තුළ, රාජ්‍ය අංශයේ සේවය ස්ථිර නොකරන ලද තාවකාලික පත්වීම් කිසිවක් ලබාදී තිබේද;

(ii) එසේ නම්, එකී පත්වීම්වල නම් කවරේද;

(iii) එක් එක් වර්ෂයේදී රජය වැටුප් සඳහා වැය කරන මුදල කෙරෙහි ඉහත කී පත්වීම්වලින් ඇති වූ බලපෑම කවරේද;

(iv) එම පත්වීම් ස්ථිර කරනු ලබන දිනය කවරේද;

(v) අනාගතයේදී එම පත්වීම්ලාභීන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලැබේද; සහ

(vi) එසේ නම්, මෙම කරුණ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රජය විසින් වෙන් කරනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1082/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කින්නියා ටී. බී. ජයා බාලිකා විද්‍යාලය සුනාමියෙන් විනාශයට පත් වූ බවත්;

(ii) එම පාසල ප්‍රතිසංස්කරණය කිරීමට මෙතෙක් කටයුතු කර නොමැතිවීමෙන් සිසු දැරියන් දැඩි අපහසුතාවයකට පත්ව ඇති බවත්;

(iii) එවැනි තත්ත්වයක් යටතේවුවද එම විද්‍යාලය මේ වන විට අ. පො. ස. (සාමාන්‍ය පෙළ) හා (උසස් පෙළ) විභාගවලින් ඉහළ ප්‍රතිඵල වාර්තාකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම පාසලේ පවතින අඩුපාඩු මගහරවා අධ්‍යාපනයේ නවෝදයක් ඇති කිරීම සඳහා නව ගොඩනැගිලි ඉදිකොට, පාසල අලුත්වැඩියා කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කින්නියා ටී. බී. ජයා බාලිකා විද්‍යාලය වෙනත් ස්ථානයකට ගෙන යාමේ සූදානමක් තිබේද;

(ii) එසේ නම්, පාසල රැගෙන යන නව ස්ථානය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල වෙනත් ස්ථානයකට රැගෙන යෑමෙන් එහි සිසු දැරියන් බොහෝ පිරිසකට ගමනාගමන දුෂ්කරතා ඇතිවන බවත්;

(ii) එම හේතුවෙන් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු අඩාළවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1541/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා මගනැගුම යන්ත්‍රෝපකරණ හා ඉදි කිරීම් සමාගම විසින් එක් එක් දිස්ත්‍රික්කයේ ඉදි කරන ලද මාර්ග හා පාලම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මාර්ග හා පාලම්වල නම් කවරේද;

(iii) එම එක් එක් මාර්ගය සහ පාලම වෙනුවෙන් ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පාලම් හා මාර්ග ඉදිකිරීම් අතරින් මග නැඟුම ආයතනය විසින් ලබාදුන් කොන්ත්‍රාත් අනුව වෙනත් ආයතන මගින් ඉදිකළ මාර්ග හා පාලම් තිබේද;

(ii) එම ඉදිකිරීම් සිදු කළ වෙනත් ආයතනවල විස්තර කවරේද;

(iii) ඔවුන් විසින් ඉදි කරන ලද මාර්ග හා පාලම්වල වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1621/’11

ගරු අනුර දිසානායක මහතා,— සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මිහින් ලංකා ආයතනයේ වත්මන් ඉහළ නිලධාරී මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරනු ලබන අය කවුරුන්ද;

(ii) එම එක් එක් නිලධාරියාගේ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) එම නිලධාරීන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලබන වැටුප්, දීමනා හා අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිහින් ලංකා ආයතනයේ 2010 වර්ෂයේ ශේෂ පත්‍රය අනුව රුපියල් බිලියන 5.6ක වත්කම් හිඟයක් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපෑ හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2028/'11

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (4)

(අ) මෙරට නොයෙකුත් ප්‍රදේශයන්හි වෙසෙන දක්ෂ නිර්මාණ ශිල්පීන්ගේ නව නිර්මාණයන්, නව සොයාගැනීම් සහ ඔවුන් විසින් නිපදවනු ලබන යන්ත්‍ර සූත්‍ර පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් තිබේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශක්තිමත් ආර්ථික මට්ටමක් නොමැති මෙරට නව නිපැයුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකුට තම නිපැයුම් වැඩිදියුණු කර ඉදිරියට ගෙන යෑමට හැකියාවක් නොමැති බවත්;

(ii) සමාජයේ ඇති හැකි අය එම පිරිසට මූල්‍යයමය උපකාර ලබා දීමට මැලිකමක් දක්වන බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) (i) නව නිපැයුම්කරුවන්ගේ නිෂ්පාදන තුළින් මෙරට ආර්ථිකයට හා ප්‍රජාවට ලැබෙන ප්‍රතිලාභ නිවැරදි ඇගයීමකට ලක්කිරීමටත්;

(ii) ඒ අනුව ඵලදායී නව නිපැයුම් කළ නිපැයුම්කරුවන්ට දිරිදීම් ලබා දී එම භාණ්ඩ නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස වැඩි දියුණු කිරීමටත්;

අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2100/'11

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේදී ආනයනය කරන ලද ඖෂධ හා ශල්‍ය උපකරණ සඳහා වරායට ගෙවූ ප්‍රමාදගාස්තු ප්‍රමාණය හා ගෙවූ පාර්ශ්වය කවරේද;

(ii) 2006, 2007, 2008 සහ 2010 වර්ෂයන්හිදී ඉහත ආනයනයන්ට අදාළව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ගෙවූ ප්‍රමාදගාස්තු වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2008 වර්ෂයේදී හඳුනාගත් හානිවූ, කල් ඉකුත් වූ හා තත්ත්වයෙන් බාල ඖෂධවල වටිනාකම කොපමණද;

(ii) එම බාල ඖෂධ සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට ඇති මුදල කොපමණද;

(iii) එම මුදල අය කර නොගැනීමට හේතු කවරේද;

(iv) 2008 වර්ෂයේදී මිලදී ගත් ඖෂධ තත්වයෙන් බාල බවට අනාවරණය වුවද ටෙන්ඩර් මණ්ඩලය නැවත මිලදී ගැනීමේදී එය නොසලකා හැරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඖෂධ සංස්ථාව විසින් සෆියුරොක්ෂිම් සෝඩියම් (Cefuroxime Sodium) මිලිග්‍රෑම් 750 එන්නත් 2,50,000 ක් මිලදී ගැනීමේදී සහ වර්ෂ 2009 දී රසායනාගාර පරීක්ෂාවකින් තොරව වෙළුම්පටි මිලදී ගැනීමේදීත්, නියමිත බර නොමැති ඇමොක්සිලින් ප්‍රතිජීවක මිලිග්‍රෑම් 250 කරල් ඒකක 6783ක් මිලදී ගැනීමේදීත් දැරීමට සිදුවූ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2247/'12

ගරු තිස්ස අත්තනායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 අප්‍රේල් 01 වැනි දින ස්ථාපිත කරනු ලැබූ බදු අභියාචනා කොමිෂන් සභාවේ නිල කාල සීමාව;

(ii) එම කොමිෂන් සභාව සඳහා පත් කරනු ලැබූ නිලධාරීන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් නිලධාරියාගේ සම්පූර්ණ නම හා අදාළ සුදුසුකම්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බදු අභියාචනා කොමිෂන් සභාව සඳහා කුලියට ගත් පස් මහල් ගොඩනැගිලි සංකීර්ණය පිහිටි ස්ථානය සහ ඒ සඳහා මාසිකව ගෙවන ලද කුලිය කවරේද;

(ii) එම කොමිෂන් සභාවේ සේවක වැටුප්, ජල බිල්පත්, විදුලිය ඇතුළු පුනරාවර්තන වියදම් වෙනුවෙන් එහි පළමු මාස හය තුළ වැයවී ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යටතේ පැවති බදු අභියාචනා ගොනු 120ක් අභිනව බදු අභියාචනා කොමිසම වෙත පැවරූ බවත්;

(ii) එම ගොනු සම්බන්ධ විභාග කිසිවක් අදාළ කාලසීමාව තුළ අවසන් කර නොමැති බවත්;

(iii) ඒ හේතුවෙන් රජයට රුපියල් කෝටි 800ක පමණ මුදලක් අහිමිව ගිය බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1755/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිවිධ හමුදාවල ලේඛන අනුව ආබාධිත රණවිරුවන්ගේ සංඛ්‍යාව යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සියලුම දීමනා ද ඇතුළුව ආබාධිත අයෙකු සඳහා මාසිකව ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) ඉහත සඳහන් කරන ලද ගෙවීම් සඳහා විශ්‍රාම වැටුප ඇතුළත්වේද;

(iv) ආබාධිත ආරක්‍ෂක හමුදා සාමාජිකයන් සඳහා ගෙවීම් කිරීම වෙනුවෙන් 2006, 2007, 2008, 2009, 2010 සහ 2011 වර්ෂවල දරන ලද මුළු වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) රජය විසින් එම විරුවන් සඳහා ලබා දී ඇති වෙනත් ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1821/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවත් මහනුවර නගරයත් යා කෙරෙන හල්ඔළුව, දොඩම්වල සංගිලි පාලම වෙනුවට ස්ථිර පාලමක් ඉදිකිරීම සඳහා කීපවරක් මුල්ගල් තබා ඇතත් මේ දක්වා එම පාලම ඉදිවී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ජනතාවගේ ගමන් පහසුව සඳහා ඉහත ස්ථානයේ නව පාලමක් ඉදි කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එලෙස වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) එම පාලම ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2034/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකුගේ ආරක්‍ෂාව සඳහා ලබා දී ඇති ආරක්‍ෂක නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආරක්‍ෂක නිලධාරීන් පොලිස් නිලධාරීන් ද, ඇමති ආරක්‍ෂක අංශයේ නිලධාරීන් ද, නැතහොත් හමුදා නිලධාරීන් ද;

(iii) උක්ත නිලධාරීන්ට අමතරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්‍ෂාව සඳහා වෙනත් පුද්ගලයින් යොදවා තිබේද;

(iv) එසේ නම්, ඔවුන් කවුරුන්ද;

(v) ආරක්ෂාව සඳහා එම පුද්ගලයින් යොදවා ගෙන ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කවුරුන්ද;

(vi) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් එවැනි පිරිසක් යොදා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත අ(i) හි සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ලබා දී ඇති පසුපෙළ රථ (Backup vehicles) සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2210/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන අනුව, අඩු ආදායම් නාගරික ජනාවාස ව්‍යාපෘතිය යටතේ නිවාස තැනීමට දෙන ලද පර්චස් දෙකක ඉඩම් කැබැල්ලේ පූර්ණ අයිතිය එහි වත්මන් පදිංචිකරුවන්ට ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත වැඩසටහන යටතේ මේ වන විට පර්චස් දෙකක පූර්ණ අයිතිය හිමිවූ පවුල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1756/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හමුදාමය නොවන කටයුතු පවරා ඇති ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් විසින් ඉටු කළ යුතු හමුදාමය නොවන කටයුතුවල ස්වභාවය කවරේද;

(iii) ඔවුන්ට හමුදාමය නොවන කටයුතු ඉටුකිරීම වෙනුවෙන් අමතර ගෙවීමක් කරනු ලැබේද;

(iv) එසේ නම්, ඉහත (iii) හි සඳහන් පරිදි ගෙවනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ත්‍රිවිධ හමුදාවල සාමාජිකයින් කිසිවෙකු ඔවුන්ට පවරනු ලබන හමුදාමය නොවන කටයුතු කිරීමට නොහැකිවීම හේතුවෙන් ඉල්ලා අස්වී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1822/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) විශාල ජන සංඛ්‍යාවක් සේවය ලබන හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මුල්ගිරිගල, වලස්මුල්ල, යහල්මුල්ල පවුල් සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල මේ වනවිට කඩා වැටීමේ අවදානමකට ලක්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මෙම ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එම මුදල කොපමණද;

(iv) එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2068/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා කොටස් වෙළඳපොලේ ආයෝජනය කර ඇති රජයේ ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනය විසින් මිලදී ගෙන ඇති කොටස් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ආයතනය අයෝජනය කරන අවස්ථාවේ දී කොටසක වටිනාකම කොපමණද;

(iv) වර්තමානයේ එම එක් එක් කොටසේ වටිනාකම කොපමණද;

(v) කොටස්වල අයෝජනය කිරීමෙන් එම ආයතන ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2211/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන අනුව, දියවර, දියවර විසිරි, ජන උදාන, ගම් උදාන ආදී විවිධ නම්වලින් ඉදි කර ඇති නිවාස යෝජනා ක්‍රම යටතේ ලබා දී ඇති නිවාස ණය හා පොලියද කපාහැර එම නිවෙස්වල සින්නක්කර අයිතිය ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත එක් එක් නිවාස යෝජනා ක්‍රමය යටතේ නිවාසවල සින්නක්කර අයිතිය හිමි වූ පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ජූලි මස 05 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0598/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) ඉදිරි වර්ෂ 8 සඳහා ප්‍රක්ෂේපිත දළ දේශීය නිෂ්පාදිතය (GDP) කොපමණද;

(ii) මේ දක්වා වූ පසුගිය වර්ෂ අටක කාලය තුළ ඒක පුද්ගල ආදායම වාර්ෂික පදනමින් කොපමණද;

(iii) මේ දක්වා වූ පසුගිය වර්ෂ අටක කාලය තුළ ඒක පුද්ගල ණය ප්‍රමාණය වාර්ෂික පදනමින් කොපමණද;

(iv) 1994/01/01, 2005/01/01 සහ 2010/08/01 යන දිනවලට ඒක පුද්ගල ඉපැයීම හා ණයවල අගයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1272/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2009 සහ 2010 වර්ෂවලදී දිවයින පුරා පිහිටි පළාත් පාසල් හා ජාතික පාසල්වල පැවති සෞන්දර්ය ගුරු පුරප්පාඩු 3174ක් පිරවීම සඳහා සෞන්දර්ය උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවූ බවත්;

(ii) ඒ අනුව පැවති ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ලිඛිත පරීක්ෂණයෙන් සහ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව මේ දක්වා සෞන්දර්ය උපාධිධාරීන් සඳහා ලබාදී ඇති මුළු ගුරු පත්වීම් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පවතින සියලුම සෞන්දර්ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා නොගත්තේ නම්, ඉතිරි සෞන්දර්ය උපාධිධාරීන්ට ගුරු පත්වීම් ලබා දෙන දිනය කවරේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1724/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ් (Industrial Finance Limited) යන නමින් බැංකු නොවන මූල්‍ය ආයතනයක් ලියාපදිංචිකර තිබේද;

(ii) එය ලියාපදිංචිකළ දිනය කවරේද;

(iii) එහි සභාපතිවරයාගේ හා අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් හා මූල්‍ය ක්‍ෂේත්‍රය තුළ ඔවුන්ගේ පළපුරුද්ද වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම සමාගම මීට පෙර වෙනත් සමාගමකට අයිතිව තිබුණේද;

(ii) එසේ නම්, එම සමාගමේ නම කවරේද;

(iii) එහි සභාපතිවරයා හා අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) I.F.L සමාගමේ දැනට සිටින ගනුදෙනුකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එහි මුදල් තැන්පත්කළ තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2011 මාර්තු 31 වැනි දිනට එම සමාගම සතුව තිබූ තැන්පතුවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1735/'11

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2011 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා ලද විදේශීය සිසුන් සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලය හා එක් එක් පාඨමාලාව අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් පීඨයට බඳවා ගත් එම සිසුන් සංඛ්‍යාව ඒ ඒ පීඨයට 2011 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගත් සම්පූර්ණ සිසුන් සංඛ්‍යාවෙන් කවර ප්‍රතිශතයක්ද;

(iii) එම විදේශීය සිසුන් අයත් රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදේශීය සිසුන් ලියාපදිංචි වී ඇති එක් එක් උපාධි පාඨමාලාව වෙනුවෙන් අය කරනු ලැබූ ගාස්තු කවරේද;

(ii) එමගින් ඒ ඒ විශ්වවිද්‍යාලය වෙත ලැබුනු ආදායම කොපමණද;

(iii) එම මුදල් වැය කරනු ලැබූ කාර්යයන් කවරේද;

(iv) එම මුදල් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත ලබා දෙනු ලැබුවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2085/'11

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, වලව ව්‍යාපාරයට අයත් රිදියගම වැව යටතේ සංවර්ධනය වන වගා බිම් අක්කර සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජලාශයේ ජලය හම්බන්තොට ඉදිවෙමින් පවතින වරාය ඇතුළු සංවර්ධන කලාපයට ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ලබා ගැනීමට අපේක්ෂිත ජල ධාරිතාව අක්කර අඩි කොපමණද;

(iv) එම ජලය රිදියගම ජලාශයෙන් ලබා ගන්නේ නම්, එම වැව යටතේ වගා කටයුතුවල යෙදෙන ගොවීන්ගේ වගාවන්ට ජල හිඟය නිසා සිදුවිය හැකි හානි වැළැක්වීම පිණිස ගනු ලබන පියවර කවරේද;

(v) එම ජල සැපයුම ලබා දීම පිණිස රිදියගම ජලාශයට අවශ්‍යතරම් ජලය ලබා ගත හැකි විකල්ප මාර්ගයක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(vi) ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

(vii) ඊට වැයවන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2101/'11

ගරු රෝසි සේනානායක මහත්මිය,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට පළමු සිසුන් කණ්ඩායම බඳවා ගනු ලැබූ දිනය කවරේද;

(ii) එම ශිෂ්‍ය කණ්ඩායම තම උපාධිය අවසන් කළ යුතු දිනය කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම වෛද්‍ය පීඨයේ අවසන් වසරේ සිසුන්ට අත්‍යවශ්‍ය මහාචාර්ය ඒකකය පිහිටුවනු ලැබ තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) මහාචාර්ය සායනික පුහුණුව එම සිසුන්ට ලබාදීමට නියමිත පළමු දිනය කවරේද;

(iv) එම මහාචාර්ය සායනික පුහුණුවට අවශ්‍ය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන්කර තිබේද;

(v) එසේ නම්, එය අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මහාචාර්ය සායනික ඒකකය සඳහා අවශ්‍ය වන හෙදියන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එම ඒකකය සඳහා අනුමතිය ලබා දී ඇති හෙදියන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2109/'11

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල විසින් සීමාසහිත ගලදාරි හෝටල් ලංකා සමාගම, සීමාසහිත ලාෆ්ස් ගෑස් සමාගම සහ සීමාසහිත සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් සමාගම යන සමාගම්වල ලබාගෙන ඇති කොටස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කොටස් ප්‍රමාණයන් මිලදී ගත් දිනයන් කවරේද;

(iii) ඉහත කී කොටස් ගත් මිල කවරේද;

(iv) එම කොටස් මිලට ගත්තේ කවර පුද්ගලයන්ගෙන්ද;

(v) ඉහත කී කොටස් මිලට ගැනීමෙන් පසු විකුණන ලද්දේ නම්, එම එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද්දේ කවර පුද්ගලයින් හටද;

(vi) ඉහත කී එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද මිල කවරේද; සහ

(vii) මෙම ගනුදෙනුවලට සම්බන්ධවූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1757/’11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුද හමුදාව සමග දැනට ව්‍යාපාර කටයුතු කරමින් සිටින හිටපු යුධ හමුදා නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ කිරීම සඳහා අවසර දිය හැකිද;

(iii) යුද හමුදාව සමග වැඩිපුරම වෙළඳ කටයුතු කරන සමාගම් 20 හි නම් සහ ඒවායෙහි අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) 2007, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂ සඳහා එම එක් එක් සමාගමේ වෙළඳ වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත සඳහන් සමාගම් යුද හමුදාව සමග ව්‍යාපාර කටයුතු කිරීමේ අවස්ථාව ලබා ගැනීමේදී ටෙන්ඩර් පටිපාටීන් අනුගමනය කරන්නේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1823/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පදිංචි හෙන්රි නෙල්සන් රත්නායක මහතා තිහගොඩ මංසන්ධියේ ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යනු ලබන බවත්;

(ii) එම පිරවුම්හලේ පෙට්‍රල් අලෙවිය සඳහා අවස්ථා කීපයකදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් අවසරය ඉල්ලා ඇතත් මේ දක්වා එම අවසරය ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉන්ධන පිරවුම්හලේ අනෙකුත් ඉන්ධන අලෙවි කිරීමට අවසර ලබාදී තිබියදී පෙට්‍රල් අලෙවියට ඉඩ නොදීමට හේතු කවරේද;

(ii) නෙල්සන් රත්නායක මහතාට පෙට්‍රල් අලෙවිය සඳහා අවසර ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2069/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 වර්ෂයේ සිට මේ දක්වා කොළඹ කොටස් වෙළඳපොළෙහි මුදල් ආයෝජනය කළ,

(i) විදේශ සමාගම්වල නම් සහ එක් එක් සමාගම විසින් අයෝජනය කළ මුදල කොපමණද;

(ii) එම ආයෝජනයන්ගෙන් මේ වන විට තම ආයෝජන ඉවත් කර ගෙන ඇති සමාගම් කවරේද;

(iii) එම ආයෝජනයන් ඉවත් කර ගත් දින කවරේද;

(iv) එම ආයෝජන ඉවත් කර ගැනීමට හේතු දක්වා තිබේද;

(v) එසේ නම්, එම හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2212/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ නාගරික මහල් නිවාස යෝජනා ක්‍රමවල පදිංචිකරුවන්ට එම නිවාසවල සින්නක්කර අයිතිය ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නාගරික මහල් නිවාසවල සින්නක්කර අයිතිය පදිංචිකරුවන්ට ලබා දීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වන විට මහල් නිවාසවල සින්නක්කර අයිතිය හිමි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1798/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ මහ නගර සීමාව තුළ පිහිටි සමහර ස්ථානවල පදිංචිකරුවන්ට ඔවුන් දැනට ජීවත්ව සිටින ස්ථාන අතහැර යන ලෙස උපදෙස් දීමට හේතු කවරේද;

(ii) එවැනි දැනුම් දීමක් කළේ කවර පදනමකින්ද;

(iii) 2011 ජූනි 01 වැනිදා සිට මේ දක්වා වූ කාලය තුළ එසේ පදිංචිකරුවන් ඉවත් කිරීමෙන් පසු කඩා බිඳ දමා ඇති නිවාස සංඛ්‍යාව කවරේද; සහ ඒවා අයත් මැතිවරණ බල ප්‍රදේශ කවරේද;

(iv) එම නිවාස කඩා දැමීමට නියෝග ලබා දුන් අමාත්‍යාංශය කවරේද;

(v) ඉවත් කරන ලද පුද්ගලයින් සඳහා ලබා දී ඇති විකල්ප නිවාස පහසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සමහර පුද්ගලයින් ඔවුන් ඉවත් කරනු ලැබූ නිවාසවල වසර 30කට අධික කාලයක් පදිංචිවී සිටි බවත්;

(ii) සමහර පදිංචිකරුවන්ට ඔවුන්ගේ නිවාස කඩා දැමීමට පෙර විකල්ප නිවාස පහසුකම් ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1824/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ පිහිටි අලවත්තාගොඩ අමුණ සහ පෙත්තරේ අමුණ මීට වර්ෂ තුනකට පමණ පෙර ප්‍රතිසංස්කරණය කළ බවත්;

(ii) මේ වන විට අලවත්තාගොඩ අමුණේ සහ පෙත්තරේ අමුණේ දොරවල් කැඩී ගොස් ඇති බවත්;

(iii) එලෙස එම අමුණු විනාශ වීමට හේතුව ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම් කටයුතු සිදු කිරීම බවට එම ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අමුණු ප්‍රතිසංස්කරණය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීමට පෙර තාක්ෂණික නිලධාරී වාර්තාව ලබා ගනු ලැබුවේද;

(iii) එම අමුණු දෙක නැවත කොන්ත්‍රාත්කරු මගින් හෝ වෙනත් ප්‍රතිපාදනයක් මගින් කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2070/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නම කුමක්ද;

(ii) මින් පෙර ඔහු දරා ඇති තනතුරු කවරේද;

(iii) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එකී තනතුරට පත් වූ දා සිට මේ දක්වා එම අධ්‍යක්ෂ ජනරාල්වරයා රාජකාරිමය වශයෙන් සංචාරයකර ඇති විදේශ රටවල් කවරේද;

(ii) එම සංචාරවලට හේතු කවරේද;

(iii) එම එක් එක් සංචාරය වෙනුවෙන් වැය කළ මුදල සහ එක් එක් සංචාරයේදී අත්කර ගත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2213/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, විදේශගත ශ්‍රමිකයන් සඳහා රජයෙන් 30%ක දායකත්වය ලබාදෙන නිවාස ණය ක්‍රමයක් සකස් කිරීමට පියවර ගන්නා බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම නිවාස ණය ක්‍රමය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වන විට එම නිවාස ණය ක්‍රමය යටතේ ණය ලබාගෙන ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 ජූලි මස 06 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0655/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) පසුගිය වර්ෂ 20ක කාලය තුළ උපාධි අපේක්ෂකයන් සඳහා ලබා දුන් මහපොළ ශිෂ්‍යත්ව සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(ii) ඉහත සඳහන් සංඛ්‍යාව සහ ඉහත සඳහන් කාල සීමාව තුළ එක් එක් වර්ෂයේදී විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව අතර සන්සන්දනය කවරේද;

(iii) පසුගිය වර්ෂ 6 තුළ ශිෂ්‍යත්වලාභීන්ට දීමනා වශයෙන් ගෙවූ මුදල වාර්ෂික පදනමින් කොපමණද;

(iv) පසුගිය වර්ෂ 10 තුළ මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට ලැබුණු ආදායම් වාර්ෂික පදනමින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1273/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද කදුරුවාන තේ කම්හල වර්ෂ හයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා ඇති බවත්;

(ii) ජාතික සම්පතක් වන එම කර්මාන්ත ශාලාව ප්‍රයෝජනයට නොගෙන අත්හැර තිබීමෙන් ජාතික ආර්ථිකයට විශාල පාඩුවක් සිදු වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තේ කම්හල ඉදිකිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(ii) එය ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා තිබීමට හේතු කවරේද;

(iii) තේ කම්හලේ නිෂ්පාදන කටයුතු කඩිනමින් ආරම්භ කොට ප්‍රදේශයේ තේ වගාකරුවන්ගේ අමු තේ දළු මිලදී ගැනීමේ ක්‍රමවේදයක් සකසන්නේද;

(iv) නිෂ්පාදන කටයුතු ආරම්භ කරන්නේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1448/'11

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ජනාධිපතිතුමා යටතේ දැනට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව,

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1857/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, පාලකුඩා මංසන්ධියේ සිට තලවිල ශාන්ත ආනා දේවස්ථානය දක්වා දිවෙන මාර්ගය පිළිසකර කිරීම සඳහා 2011 වර්ෂයේදී වෙන් කළ මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ සංවර්ධන කිරීමට ඇස්තමේන්තුගත කර ඇති මාර්ගයේ දිග හා පළල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය පිළිසකර කිරීමේ කොන්ත්‍රාත්තුව ලබා දීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළේද;

(ii) එම මාර්ගය පිළිසකර කළ ආයතනයේ නම, එහි අයිතිකරුගේ නම, ලිපිනය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු කවරේද;

(iii) මාර්ගය ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් එම සමාගමට ගෙවිය යුතු සියලු ගෙවීම් මේ වන විට ගෙවා අවසන් කර තිබේද;

(iv) නොඑසේ නම්, තවදුරටත් ගෙවීමට ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පිළිසකර කිරීමෙන් පසුව ඉහත මාර්ගය මත තල් හෝ වෙනත් ශාක වර්ගයක් පැළවී තිබේද;

(ii) නියමිත ප්‍රමිතියට සකස් කළ විට මාර්ගයක් මත ශාක වර්ග පැළවීමේ හැකියාවක් තිබේද:

(iii) ඉහත මාර්ගයේ ශාක වර්ග පැළවීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2104/'11

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාවේදී උසස් පෙළ සමත් වූ,

(i) පෞද්ගලික සහ පාසල් අයදුම්කරුවන් සංඛ්‍යාව;

(ii) පාසල් අයදුම්කරුවන් ලෙස පෙනී සිටි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය සිසුන් සංඛ්‍යාව;

(iii) පෞද්ගලික අයදුම්කරුවන් ලෙස පෙනී සිටි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය සිසුන් සංඛ්‍යාව;

(iv) සිසුන් සංඛ්‍යාව විෂයය ධාරාව අනුව;

(v) සිසුන් සංඛ්‍යාව දිස්ත්‍රික් පදනම මත;

වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාව තුළ රජයේ පාසල්වල සිටි උසස් පෙළ ගුරුවරුන් සංඛ්‍යාව;

(i) එක් එක් විෂයධාරාව අනුව;

(ii) ජාතික පාසල් සහ පළාත් පාසල් අනුව;

(iii) භාෂා මාධ්‍ය අනුව;

(iv) දිස්ත්‍රික්කය අනුව;

වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2214/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, මධ්‍යම පාන්තිකයන්ට පහසු මිලට ලබාදීම සඳහා තට්ටු නිවාස ඉදිකරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මධ්‍යම පාන්තිකයන්ට පහසු මිලට ලබා දීම සඳහා තට්ටු නිවාස ඉදිකිරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති එම තට්ටු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම තට්ටු නිවාස ඉදිකර ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2361/'12

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ණය පියවීමට මූල්‍ය සම්පාදනය සඳහා විදේශීය මූලාශ්‍රයකින් ඇ. එ. ජ. ඩොලර් බිලියන 1ක මුදලක් ලබාගැනීමට නියමිතව තිබේද; සහ

(ii) ඉහත කී ගනුදෙනුව හා සම්බන්ධ බවට ප්‍රකාශිත 'ගෝල්ඩ්මන් සැක්ස්' ආයෝජන බැංකුව හා එහි දේශීය හෝ විදේශීය නියෝජිතයන් සමග ඒ සම්බන්ධයෙන් සිදු කෙරෙමින් පවතින සාකච්ඡාවන්හි විෂයපථය පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත (අ) (ii) හි සඳහන් නියෝජිතයන්ට;

(i) පිරමිඩ් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්;

(ii) ශ්‍රී ලංකාවේ හෝ අන් කවර හෝ ස්ථානයක බැංකු හා ව්‍යාපාරික ආයතන සමග ගිවිසුම් හෝ යම් ණය බැඳීම්වලට අදාළව විශ්වාසය කඩකිරීම් සම්බන්ධයෙන්;

(iii) මහ බැංකුවේ උසස් නිලධාරීන් සමඟ සමීප පෞද්ගලික සබඳතා හා ව්‍යාපාරික ජාල පැවතීම සම්බන්ධයෙන්;

චෝදනා කරනු ලැබ හෝ දෝෂාරෝපණය කරනු ලැබ තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) "ඔබගේ ගනුදෙනුකරු හැඳිනගන්න" ප්‍රතිපත්තියට අනුකූල වීම සහතික කිරීම හා මෙයට සම්බන්ධ අරමුදල් මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදය හා සම්බන්ධ මූල්‍ය සම්පාදනය මගින් දූෂ්‍ය වූ මුදල් වීමේ අවදානම අවම කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග අනුගමනය කෙරෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1799/'11

ගරු රවි කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට තුළ නොයෙකුත් ප්‍රදේශවල වරින් වර සිදුවූ විදුලි විසන්ධිවීම් විදුලිබල මණ්ඩලයේ දැනුවත් බවින් තොරව සිදු වූයේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කැළණිතිස්ස බලාගාරයේ විදුලිබල මණ්ඩලය සතු විදුලි ජනක (115 MW) යන්ත්‍ර සඳහා සපයන ලද ඩීසල් ලීටරයකට 2011 ජූනි මාසය තුළ ගෙවන ලද මිල කොපමණද;

(ii) කැළණිතිස්ස බලාගාරයේ AES විදුලි ජනක යන්ත්‍ර සඳහා සපයන ලද ඩීසල් ලීටරයකට ගෙවන ලද මිල කොපමණද;

(iii) කැළණිතිස්ස බලාගාරයේ ඉන්ධන ටැංකි පද්ධතියේ ධාරිතාව කොපමණද;

(iv) 2011 ජූලි මස 4, 5, 6 සහ 7 දිනවල එම ධාරිතාවය එම ටැංකිවල තිබුනේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කැළණිතිස්ස බලාගාරයේ විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා දිනකට අවශ්‍ය ඩීසල් ලීටර සංඛ්‍යාව කොපමණද;

(ii) 2011 ජූලි මස 7 වැනි දින කැළණිතිස්ස බලාගාරයේ සියලුම විදුලි ජනක යන්ත්‍ර ක්‍රියා විරහිතවීමට ඉන්ධන නොමැති වීම හේතු වූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1825/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කයේ, ගල්ඔය ව්‍යාපාරය ආරම්භයත් සමග ඉදිකළ අම්පාර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ''ක්ෂේත්‍ර නිවහන'' විනාශයට යමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ක්ෂේත්‍ර නිවහන කඩිනමින් ප්‍රතිසංස්කරණය කර එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ නවාතැන් අවශ්‍යතා ඉටුකර දීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2071/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත සහල් සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් සහල් සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2215/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ''මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා'' ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, සෑම ගමකටම වර්ෂයකට නිවාස 25 බැගින් ඉදිකිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වන විට ඉදිකිරීම් අවසන් කර, ප්‍රතිලාභීන් පදිංචි කර ඇති සමස්ත නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස පිහිටි ගම්වල නම් කවරේද;

(iii) එක් නිවසක් ඉදිකිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1826/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 ලෝක කුසළාන ක්‍රිකට් තරඟාවලියට අදාළව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සිදුකළ වියදම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ප්‍රීමියර් ලීග් ක්‍රිකට් තරඟාවලියේ විකාශන අයිතිය ලබා දී තිබෙන සමාගමෙහි නම කුමක්ද;

(ii) එම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරන පුද්ගලයා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලියේදී ශ්‍රී ලංකාවට ලැබුණු මුදල් සම්භාරයෙන් හම්බන්තොට ක්‍රීඩාංගණය ගොඩනැගීමට සහ අනෙකුත් ක්‍රීඩාංගණ සඳහා වැයකළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1849/'11

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 වසරේ සිට මේ දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂයේදී රජය විසින් ඉතාලිය සහ මැලේසියාව යන රටවලට රැකියා සඳහා යවන ලද ශ්‍රී ලාංකිකයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඉතාලිය සහ මැලේසියාව පුද්ගලයන් යැවීමේදී ඒ සඳහා පාදක කරගත් නිර්නායකය කවරේද;

(iii) එම රටවල රැකියාවක් ලබාදීම සඳහා එක් පුද්ගලයෙකුගෙන් අයකරගත් මුදල කොපමණද;

(iv) ඉහත කී රටවලට රජය විසින් යවන ලද පුද්ගලයෙකුගේ රැකියාවට අදාළ ගිවිසුමේ කාලසීමාව කවරේද;

(v) එම රටවල රැකියාවක නියුතු පුද්ගලයෙකුගේ සාමාන්‍ය වැටුප කොපමණද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2072/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාරියපොල නගරයේ ඉදිකළ වයඹ ආර්ථික මධ්‍යස්ථානයට මුල්ගල තබන ලද දිනය කවරේද;

(ii) එහි වැඩ නිම කරන ලද දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) එහි ඉදිකිරීම් නිම වන විට වැය වූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ආර්ථික මධ්‍යස්ථානයේ වෙළඳ කටයුතු ආරම්භකරන ලද දිනය කවරේද;

(ii) මේ වන විට එහි වෙළඳ කටයුතු සිදු නොකරන්නේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) වාරියපොල ආර්ථික මධ්‍යස්ථානයක් ඇති කිරීම සඳහා බලපෑ හේතු කවරේද;

(ii) එම මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ අයිතිකරු කවුරුන්ද;

(iii) ඒ සඳහා මාසිකව හෝ වාර්ෂිකව බදු හෝ කුලී ගෙවීමක් සිදු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2216/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) “මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා” ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, පළමු වර්ෂ පහේදී පොලිය පමණක් ගෙවීමේ පහසුකම සහිත නිවාස ණය යෝජනා ක්‍රමයක් ඇතිකිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි එම නිවාස ණය යෝජනා ක්‍රමය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වන විට එකී නිවාස ණය ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නිවාස ණය ලබා දීමේදී ප්‍රතිලාභීන් තෝරා ගත් පදනම කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 9/’10

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/’10

ගරු රවී කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/’10

ගරු රවී කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'10

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'10

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා ''තත්ත්ව ආරක්ෂණ සභාවක්'' නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

ගරු රවී කරුණානායක මහතා,— ''විශේෂ නඩු පවරන නිලධාරී'' නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු

ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" නමින් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

ගරු රවී කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ත වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

ගරු රවි කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

ගරු රවි කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

ගරු රවි කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

ගරු රවි කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

ගරු රවි කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

ගරු රවි කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

ගරු රවි කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

